# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2015 අංක 8 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2015 ජුනි මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2015 ජුනි මස 05 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2015 අංක 8 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2015 ජුනි මස 03 වන දින]

එල්.ඩී.—ඕ. 39/2009.

**1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැළැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2015 අංක 8 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1997 අංක 32 දරන පනත ඉවත් කිරීම.

3. (1) (මෙහි මින්මතු "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත ඉවත් කිරීම නොතකා:— ව්‍යාවර්ථන.

(අ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ සේවා නියුක්තිය සඳහා කැමැත්ත ප්‍රකාශ කල අධිකාරියේ සියලු නිලධරයන් හා සේවා නියුක්තිකයන් මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට බලපවත්වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ සේවයේ නියුක්ත නිලධරයන් සහ සේවා නියුක්තිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කරන ලද පනතේ 17 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලේ බැරට ඇති සියලු මුදල් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට බලපවත්වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ අරමුදලට මාරුකරනු ලැබිය යුතු ය;

2—PL 008999—2,850 (2015/04)

(ඇ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට බලපවත්වන පරිදි ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ අධිකාරියේ සියලු නිශ්චල හා චංචල දේපල සහ සියලු වත්කම් හා බැරකම් ජාතික අධ්‍යාපන ආයතනයට මාරු කරනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ අධිකාරියට අයවිය යුතු සියලු ණය, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට බලපවත්වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනයට අය විය යුතු ණය වශයෙන් සළකනු ලැබිය යුතු ය;

(ඉ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ, මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින සියලු නඩු කටයුතු මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට බලපවත්වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලැබූ අධිකාරියේ වාසියට හෝ ඊට එරෙහිව යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් ප්‍රකාශයට පත් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥාවන් මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට බලපවත්වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ වාසියට හෝ ඊට එරෙහිව ප්‍රකාශයට පත් කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥාවන් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය; සහ

(උ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ අධිකාරිය විසින් එළඹුන සහ මේ පනත ක්‍රියාත්මකවීමට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු ගිවිසුම් මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට බලපවත්වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනය විසින් එළඹුන ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා-

"අධිකාරිය" යන්නෙන් ඉවත් කරන ලද පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය අදහස් වේ.

"ජාතික අධ්‍යාපන ආයතනය" යන්නෙන් 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත යටතේ පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනය අදහස් වේ.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.